තිරප්පනේ ප්‍රාදේශීය සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කය.

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 01 වන දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 අගෝස්තු මස 26 දින ද විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

-------------------------

මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමේදී සභාව විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩු පාඩු

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩු පාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදු වී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අඩුපාඩුවේ ස්වාභාවය | | විෂයයන් ගණන | වටිනාකම | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වගකීම් | වත්කම් |
| | | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 01 | - | - | ගණනය කර නැත | - |
| | - එම - | 01 | - | - | - | 185 |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 03 | - | 17 | - | - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 03 | 294 | - | - | - |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 02 | - | - | - | 60 |

1.3.3 නොසැසඳුණු ගිණුම්

ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.4,093,713 ක් වූ අතර, උපයෝගී ලේඛන හා වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.2,026,716 ක් විය.

1.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලංකා බැංකුවේ ස්ථිර තැන්පතු ශේෂය රු.28,000 ක් ද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව ස්ථිර තැන්පතුවේ වටිනාකම රු.24,744 ක් ද විය. මෙම වෙනසට හේතු පැහැදිලි නොවීය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු පළාත් පාලන සේවක දායක මුදල් රු.403,454 ක් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර දායක මුදල් ගෙවිය යුතු නිලධාරීන්ගේ විස්තර සහ ප්‍රාදේශීය සභාවේ සේවය කළ කාලය තහවුරු කරගෙන නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,405,746 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.7 අනුකූල නොවීම්

-------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | |
| | 154 වගන්තිය | මාසිකව රු.50,000 ක් හෝ වර්ෂයකට රු.500,000 ක් නිශ්චිත ගෙවීම් කිරීමේදී එම ගෙවීම මත 5% ක රඳවා ගැනීමේ බද්දක් අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ඉහත සීමාව ඉක්මවා කරනු ලැබූ ගෙවීම් වලින් රු.72,024 ක රඳවා ගැනීමේ බදු අය කර නොතිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර අවුරුදු 02 ට වැඩි කාලයක් ඉක්මවූ රු.33,500 ක් වූ පොදු තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.106,638 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.380,107 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (අ) | වරිපනම් හා බදු | 400 | 312 | 167 | 245 | 852 | 100 |
| (ආ) | කුලී මුදල් | 500 | 587 | 471 | 573 | 504 | 378 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 780 | 476 | 84 | 780 | 456 | 86 |
| (ඈ) | වෙනත් ආදායම් | 2,000 | 7,095 | 1,276 | 1,076 | 2,125 | 1,828 |

#### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.230,997 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.557,610 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 මස්කඩ බදු

පළාත් පාලන කොමසාරිස්ගේ 1989 සැප්තැම්බර් 30 දිනැති අංක එල්ජ්/3 දරන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික බදු මුදලින් 1/3 ක් එකවර ලබාගැනීමෙන් පසුව ඉතිරි මුදල සමාන වාරික 06 කින් අය කළ යුතු වුවත් එසේ නොකිරීම නිසා 2010 දෙසැම්බර් 31 දිනට සඳපාගම ගවමස් වෙළඳ සැලෙන් අයවිය යුතු හිඟ කුලිය රු.21,670 ක් විය.

2.2.5 කඩකාමර කුලී

සභාව සතු කඩ කාමර කුලියට දීමෙන් 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ කුලී රු.512,287 ක් වූ අතර, එය වසර 01 සිට 08 දක්වා වූ කාල පරාසයකට අයත් හිඟ ආදායම් බව නිරීක්ෂණය විය. මෙම හිඟ ආදායම් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය අනුව ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.2.6 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල පිහිටි යම් ස්ථානයක් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය, වෙළදාම හෝ බෙදාහැරීම සඳහා යොදා ගැනීම පිණිස යම් තැනැත්තෙකුට අවසර දිය හැක්කේ ප්‍රාදේශීය සභාව විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලබාගෙන තිබේනම් පමණකි. 2010 දෙසැම්බර් 31 දිනට එවැනි කාර්යයන් සඳහා ස්ථාන පාවිච්චි කළ 11 දෙනෙකුගෙන් රු.83,850 ක් ලැබිය යුතුව තිබුණු අතර එයින් අදහස් වන්නේ බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ඔවුන් එම ස්ථාන භාවිතා කර ඇති බවය.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැය ගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගල පඩි | | | | | | |
| නඩි | 7,000 | 6,877 | 123 | 7,836 | 6,524 | 1,312 |
| අනෙකුත් | 2,000 | 1,703 | 297 | 1,740 | 2,229 | (489) |
| උප එකතුව | 9,000 | 8,580 | 420 | 9,576 | 8,753 | 823 |
| ප්‍රාග්ධන වියදම | 15,000 | 24,819 | (9,819) | 13,600 | 11,703 | 1,897 |
| මුළු එකතුව | 24,000 | 33,399 | (9,399) | 23,176 | 20,456 | 2,720 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 04 | 05 |
| ප්‍රාථමික | 20 | 19 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 03 |

| | | |
|---|---|---|
| එකතුව | 25 | 28 |
| | ===== | ==== |

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාව ඉක්මවා බඳවා ගත් කාර්මික නිලධාරියෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල සභා අරමුදලින් රු.113,000 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්

සහල්පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2009 දෙසැම්බර් 31 දිනට රු.1,475,990 ක් වැය කර ඇතත් එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ නොකිරීම නිසා අදාල වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

2.5.2 අය වීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.652,438 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.5,461 ක් විය.

2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු.16,819,483 ක් විය.

2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

2009 සහ 2010 වර්ෂ තුලදී නිලධාරීන්ට ගෙවන ලද රු.469,825 ක තත්කාර්ය අතුරු අග්‍රිම වලින් 2010 දෙසැම්බර් 31 දිනට රු.448,824 ක අග්‍රිම පියවා නොතිබුණු අතර එම නොපියවූ ශේෂය සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි. මෙසේ පොත් වලින් කපා හැරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තියේ විධිවිධාන අනුව සභාවේ සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ලබාගෙන නොතිබුණි.

2.7 අවිධිමත් ගනුදෙනු

(අ). පොදු වැදගත්කමකින් යුත් උත්සව පැවැත්වීම හෝ ආගමික, සංස්කෘතික සෞඛ්‍ය විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයන් සම්බන්ධයෙන් වාර්ෂික එකතුව රු.1,000 ඉක්මවා වියදම් දැරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (අ) වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබානොගෙන සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 06 ක දී රු.62,037 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ). ගල්කුලම නගරයේ කසල බැහැර කිරීම සඳහා අත්ට්‍රැක්ටරයක් කුලියට ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 වගන්තිය අනුව ප්‍රසම්පාදන පර්පාටිය අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේදී අවස්ථා හතරකදී රු.60,800 ක් ගෙවීම් කර තිබුණි.

2.8 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුඟ සාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගී සේවාවන්ට අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

2.9 කොන්ත්‍රාත් පර්පාලනය

ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති

2010 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු වටිනාකම රු.2,450,000 ක්වූ පහත සඳහන් ගමනැගුම ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

| | කර්මාන්තයේ නම | ඇස්තමේන්තුගත මුදල |
|---|---|---|
| | | රු. |
| (i). | 525 දෙමටවැව අතුරු මාර්ගය බෝක්කු දමා ඉදිකිරීම | 300,000 |
| (ii). | 553 මීවැල්ලැව ඒරුවැව මාර්ගය ප්‍රතිසංස්කරණ කිරීම | 350,000 |
| (iii). | 540 ඉටිටිකට්ටිය වැව පාර ප්‍රතිසංස්කරණය කිරීම | 300,000 |
| (iv). | 553 දෙමටවැව සිට තිරප්පනේ වැව දක්වා අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය | 700,000 |
| (v). | පයිරම්ඩුව ජල යෝජනා ක්‍රමය | 500,000 |
| (vi). | තිරප්පනේ නගරයේ ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන පිවිසුම් අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 300,000 |
| | | 2,450,000 |

2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ණය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම